# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1698/23 - 2011 මාර්තු 25 වැනි සිකුරාදා - 2011.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

මගේ අංකය: 1/6/6/II

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2011 අංක... දරන වයඹ පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය

මෙහි පහත පළ කරන වයඹ පළාතේ පළාත් සභාවේ 2011 අංක... දරන වයඹ පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය අද දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධි විධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු ඇතොත් ඒවා එදිනට පෙර මා වෙත ඉදිරිපත් කල යුතු වේ.

ඩී. බී. හේරත්,
කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, ගොවිජන සංවර්ධන සහ
සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍ය.

කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, ගොවිජන සංවර්ධන සහ
සත්ත්ව නිස්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය
දඹුල්ල පාර, කුරුණෑගල.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2011 අංක... දරන වයඹ පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය**

පූර්විකාව

වයඹ පළාත තුළ තිරසාර සංවර්ධනය උදෙසා වූ පළාත් කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ අරමුණු ලඟාකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වැනි උපලේඛනයේ I වන ලැයිස්තුවේ අංක 9 යටතේ පළාත් සභා වෙත පවරා ඇති විෂයයන් සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම සහ මෙහෙය වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම සඳහා සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ —

ලුහුඬුනාමය සහ ක්‍රියාත්මකවන දිනය

1. "මෙම ප්‍රඥප්තිය" වයඹ පළාතේ පළාත් සභාවේ 2011 අංක... දරන වයඹ පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙය වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

ප්‍රඥප්තියේ අරමුණු

(1) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාත් කෘෂිකර්ම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම, සැලසුම් සකස්කිරීම, ක්‍රියාත්මක කරවීම සහ මෙහෙයවීම;

(2) ගොවි ජනතාවගේ ජීවනෝපාය උසස් කරලීම පදනම් වූ කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය හා කෘෂිකාර්මික සේවාද ඇතුළුව කෘෂිකර්මය සහ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා වැඩසටහන් සම්පාදනය කර පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම;

(3) පළාත් කෘෂිකර්ම කමිටුව පිහිටුවීම;

(4) කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ ස්වේච්ඡා සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචි කිරීම;

(5) පළාත තුළ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යෙදෙන වෙනත් ආයතන ලියාපදිංචි කිරීම;

(6) ප්‍රඥප්තියේ සඳහන් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම;

(7) රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන ස්වේච්ඡා සංවිධාන, සහ පුද්ගලයින් සම්බන්ධීකරණය සහ ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම;

(8) වයඹ පළාතට ආවේනික දේශීය හා සම්ප්‍රදායික කෘෂිකාර්මික සංස්කෘතීන් සහ සම්පත් සංරක්ෂණය හා ව්‍යාප්තියට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම;

(9) වගා නොකරන ඉඩම් වගා කිරීමට පෙළඹවීම.

### *1 වැනි කොටස*
### *ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කිරීම*

**කෘෂිකර්ම ප්‍රතිපත්තිය**

3 ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාත තුල කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය කිරිමේ වගකීම පළාත් අමාත්‍යාංශය වෙත පැවරෙන්නේය. ඒ සඳහා පළාත තුළ ස්ථාපිත කෘෂිකර්ම කමිටුවල සහ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයින්ගේ යෝජනා ලබාගත හැකි වන්නේය.

**පළාත් කෘෂිකර්ම සැලැස්ම**

4 පළාත තුළ භූමි ප්‍රමාණයට සාපේක්ෂව ජනගහන ව්‍යාප්තිය, භූගෝලීය සාධක, දේශගුණික තත්ත්වයන්, පාරිසරික බැලපෑම්, ගමනාගමන පහසුකම් හා වෙනත් නිර්නායකයන් පදනම්කරගෙන වසර පහකට වරක් පළාත් කෘෂිකාර්මික සැලැස්ම මෙහි මින් මතු “අධ්‍යක්ෂවරයා” යැයි කියනු ලබන වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් සකස්කර මෙහි මින් මතු “කමිටුව” යැයි කියනු ලබන වයඹ පළාත් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන්නේය.

**කෘෂිකාර්මික සේවාවන් සැපයිය යුතු බව**

5 පළාතේ ගොවි ජනතාවට අවශ්‍ය වන කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, අලෙවිය හා අලෙවි සම්බන්ධීකරණය, පළාත්බද පර්යේෂණ සහ බීජ සහතික කිරීම ඇතුලුව කෘෂිකාර්මික සේවාවන් මෙම ප්‍රඥප්තියේ සිද්ධාන්තයන් සහ විධිවිධානයන්ට අනුකූලව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වන්නේය.

**කෘෂිකාර්මික ආයතන ඇති කිරීම හා කොට්ඨාශ ප්‍රතිසංවිධානය කිරීම**

6 පළාත තුළ ජනගහන ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, දේශගුණික තත්ත්වයන් පාරිසරික බලපෑම් සහ ගමනාගමන පහසුකම් ආදිය පදනම්කරගෙන කලාප කාර්යාල ඇතිකිරීම සහ කෘෂිකර්ම ව්‍යාප්ති කොට්ඨාශ ප්‍රතිසංවිධානය කිරීම සිදුකල හැකි වන්නේ ය.

**අමාත්‍යවරයා සතු බලතල**

7 මෙම ප්‍රඥප්තියෙහි සිද්ධාන්ත සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග සකස් කිරීම, උපදෙස් නිකුත් කිරීම හා මගපෙන්වීම මෙහි මින් මතු “අමාත්‍යවරයා” යැයි කියනු ලබන වයඹ පළාත් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිවන්නේ ය.

**අභියාචනා කිරීම**

8 මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ හෝ කිසියම් නිලධරියෙකු විසින් කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැක්කේය. අමාත්‍යවරයා විසින් හෝ ඔහු විසින් පත් කරනු ලබන නිලධාරියෙකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව එම නියමය හෝ තීරණය පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැකි වන්නේය.

9 මෙම ප්‍රඥප්තියෙහි සිද්ධාන්ත හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් හා මගපෙන්වීම් යටතේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති, තීරණවලට අනුකූලව පළාත් කෘෂිකාර්මික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පාලනය ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය. ලේකම්වරයා සතු බලතල

*2 වැනි කොටස*

*පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංයුතිය හා කාර්යභාරය*

10 මෙම ප්‍රඥප්තියේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා මෙහි මින් මතු ''දෙපාර්තමේන්තුව'' යනුවෙන් හඳුන්වනු ලබන, ''වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව'' වන්නේ ය. දෙපාර්තමේන්තුව පිහිටුවීම

11 දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ''වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා'' යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු පළාත් අමාත්‍යවරයාගේ එකඟතාවය මත වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කල යුතු වන්නේය. දෙපාර්තමේන්තු ප්‍රධානියා පත්කිරීම.

12 (1) අධ්‍යක්ෂවරයාගේ බලතල සහ කාර්යන් ක්‍රියාත්මක කිරීමට සහ කළමනාකරණය සඳහා අවශ්‍යවන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්, කෘෂිකර්ම උපදේශකවරුන්ථ ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්තිකාරකයින් හා අවශ්‍ය ප්‍රමාණයට අනෙකුත් නිලධාරීන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පත්කල යුතු වන්නේය. නිලධාරීන් පත් කිරීම

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙර දින වයඹ පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත තනතුරු දැරූ සියළුම නිලධාරීන් සහ සේවකයින් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවා සේ සැලකිය යුතු වන්නේය.

13 (1) අමාත්‍යවරයාගේ හා ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට යටත්ව මෙම ප්‍රඥප්තියෙහි හෝ ඊට ආනුෂාංගිකව හෝ පනවනු ලබන නියෝග හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලතල අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේය. අධ්‍යක්ෂවරයා සතු බලතල

(2) අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන් හට පැවරිය හැකි වන්නේය.

14 කෘෂි දේශගුණික කලාප මට්ටමින් කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන කලාපීය කෘෂි සම්පත් මධ්‍යස්ථාන, කෘෂිකර්ම උපදේශක කාර්යාල පිහිටුවා පවත්වාගෙන යා යුතු වන්නේ ය. කලාප/උපදේශක කාර්යාල පිහිටුවීම

15 කෘෂිකාර්මික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන හා පුහුණු අංශයක්/ඒකකයක් පිහිටුවිය හැක්කේය. පුහුණු අංශ පිහිටුවීම

16 ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතනය ලෙස නාමෝදිෂ්ඨ ආයතන හැර පළාතට අවශ්‍ය විය හැකි පර්යේෂණ කටයුතු සඳහා ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යා හැකි වන්නේය. පර්යේෂණ ආයතන පිහිටුවීම

17 පළාත් කෘෂිකාර්මික සැලැස්ම පදනම් කරගනිමින් පළාත තුළ ඇති කෘෂිකාර්මික ආයතන හා කෘෂිකාර්මික කටයුතුවල ප්‍රවර්ධනය සඳහා වූ සංවර්ධන සැලැස්ම අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව සකස්කර ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වන්නේය. වාර්ෂික සංවර්ධන සැලැස්ම

18 පළාත තුළ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් සේවාවන් පවත්වාගෙන යා යුතු වන්නේයඃ- දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

(1) කෘෂිකාර්මික ව්‍යාප්තිය හා පුහුණු උපදේශක සේවාවන් පැවැත්වීම;

(2) පළාත් බද කෘෂිකාර්මික පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම;

(3) පළාත් සඳහා කෘෂිකාර්මික සංවර්ධන සැලසුම් හා වාර්ෂික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම;

(4) ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ පර්යේෂණ ආයතන, විශ්ව විද්‍යාල සහ කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම;

(5) කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය තාක්ෂණය හඳුන්වා දීම;
(6) උසස් තත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය, හඳුන්වාදීම සහ අලෙවිය;
(7) කාබනික හා රසායනික පොහොර කෘෂි රසායනික ද්‍රව්‍ය සහ කෘෂිකාර්මික උපකරණ හඳුන්වා දීම;
(8) කෘෂි කාර්මික කටයුතුවල නියලෙන ස්වේච්ඡා සංවිධාන ලියා පදිංචි කිරීම;
(9) කෘෂිකාර්මික කටයුතු සඳහා ණය ආධාර ලබා දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;
(10) කාන්තා ගොවි සමිතිය තරුණ ගොවි සමිති සහ පාසල් පද්ධතිය අදාළ කරගෙන කෘෂිකර්මය නගා සිටුවීමට කටයුතු කිරීම;
(11) පළාත් ආහාර හා පෝෂණ සුරක්ෂිතතා ඉලක්කයන් සපුරාලීම ඉටුවන අයුරින් සැලැසුම් ක්‍රියාත්මක කරවීමට සහාය වීම;
(12) පළාත තුළ ක්‍රියාත්මක කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ දත්ත පද්ධති පවත්වාගැනීම හා අවශ්‍ය ආයතනවලට ලබාදීම;
(13) කෘෂිකාර්මික නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙනයාමට හා පසු අස්වනු තාක්ෂණය පිළිබඳව කටයුතු කිරීම;
(14) කාබනික නිෂ්පාදන හඳුන්වාදීම, ප්‍රචලිත කිරීම හා අලෙවිය;
(15) කාබනික පොහොර හා නිෂ්පාදන ආයතන පළාත් මට්ටමින් ලියා පදිංචි කිරීම සහ තත්ත්ව සහතික නිකුත් කිරීම;
(16) පළාතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය වල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ සේවාවක් පවත්වාගෙන යාම,
(17) වගා හානි තක්සේරු වාර්තා නිකුත් කිරීම සහ ඇස්තමේනතු කිරීම;
(18) පලිබෝධ නාශක භාවිතය සම්බන්ධයෙන් උපදෙස් සැපයීම;
(19) දේශීය හා සම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු හා සම්පත් සංරක්ෂණය හා ව්‍යාප්තියට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම.

*3 වැනි කොටස*

*පළාත් කෘෂිකර්ම කමිටුව*

පළාත් කෘෂිකර්ම කමිටුව

19. පළාත් කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පහසුවනු පිණිස මෙහි මින්පසු "කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන පළාත් කෘෂිකර්ම කමිටුවක් ස්ථාපිත කළ යුතු වන්නේය. පළාත් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා මෙම කමිටුවේ සභාපතිවරයා වන අතර කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වන්නේය. මෙම කමිටුව පළාත් සත්ව නිෂ්පාදන හා සංවර්ධන කමිටුව සමග ඒකාබද්ධව පවත්වන්නේය.

කමිටුවේ සාමාජිකයන්

20. මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු වන්නේය:-

(1) කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරුන්;
(2) කුරුණෑගල, පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන්;
(3) පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (වයඹ);
(4) පළාත් සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ (වයඹ);
(5) පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ);
(6) පළාත් ඉංජිනේරු අධ්‍යක්ෂ (වයඹ);
(7) වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ;
(8) කුරුණෑගල, පුත්තලම ගොවිජන සේවා නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන්;
(9) සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සංවර්ධන අධිකාරිය (වයඹ)
(10) සාමාන්‍යාධිකාරී - වයඹ සංවර්ධන අධිකාරිය
(11) අධ්‍යක්ෂ - පළාත් පරිසර අධිකාරිය
(12) කුරුණෑගල, පුත්තලම නියෝජ්‍ය පොලිස්පතිවරු;
(13) පළාත් තුළ ක්‍රියාත්මක වන කෘෂිකර්මය සත්ව නිෂ්පාදන සහ වාරිමාර්ග කටයුතුවලට අදාළව ක්‍රියාත්මක කරණු ලබන රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ විශේෂ ව්‍යාපෘතිවල නිලධාරීන්;
(14) කුරුණෑගල, පුත්තලම අපනයන කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ;
(15) වයඹ පොල්වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකරුවන්;
(16) කජු සංස්ථාවේ වයඹ පළාත් කළමණාකරු;
(17) කෘෂි කාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කළමනාකරුවන්
(18) වයඹ පළාත් ජලජීවී සහකාර අධ්‍යක්ෂ;
(19) කුරුණෑගල, පුත්තලම වන සංරක්ෂණ දිස්ත්‍රික් නිලධාරීන්;

(20) වයඹ පළාත් වනජීවී සහකාර අධ්‍යක්ෂ;
(21) අවශ්‍යතාවය මත පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන කලාප භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් ;
(22) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ;
(23) පළාත් කළමණාකරු, වී අලෙවි මණ්ඩලය;
(24) අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය;
(25) රාජ්‍ය බැංකු ප්‍රාදේශීය කළමනාකරුවන් හෝ ඔවුන් විසින් නම් කරන ලද නිලධාරියෙකු ;
(26) කෘෂිකර්මය සම්බන්ධ ප්‍රධාන සමාගම් වල ප්‍රධානීන් ;
(27) කෘෂිකර්මය පිළිබඳ විශේෂ දැනුමක් ඇති ප්‍රවීනයන් දෙදෙනකු ;
(28) කෘෂි නිෂ්පාදන සමිති බල මණ්ඩල නියෝජිතයන් දෙදෙනකු ;
(29) ගොවි සංවිධාන බල මණ්ඩල නියෝජිතයන් දෙදෙනකු ;
(30) අවස්ථානුකූලව අමාත්‍යවරයා විසින් නම් කරන ලද රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන හෝ සංවිධානවල නියෝජිතයන්.

**කමිටුවේ සාමාජිකයින් පත් කිරීම**

21. මෙහි 20.1 සිට 20.25 දක්වා සාමාජිකයින් නිල බලයෙන් මෙම මණ්ඩලයට පත්වන අතර 20.26 සිට 20.30 දක්වා සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි පත්කළ හැක්කේය.

**සාමාජිකයින්ගේ ධූර කාලය**

22. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය වසර 02ක් වන්නේය.

**සාමාජිකත්වය අහෝසිවීම**

23. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය සම්පූර්ණවීම, ධූරයෙන් ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ධූරයෙන් ඉවත් කිරීම සහ සාමාජිකයෙකුගේ මරණය හෝ සිහිවිකලත්වය මත සාමාජිකත්වය පුරප්පාඩු විය හැකි අතර එම පුරප්පාඩු අමාත්‍යවරයා විසින් සම්පූර්ණ කල යුතු වන්නේය.

**කමිටුවේ රැස්වීම්.**

24. මෙම කමිටුව යටත් පිරිසෙයින් මාස 02කට වරක් බැගින් රැස්විය යුතු වන්නේය. අවශ්‍යවන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම් විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැකිය.

**ගණ පූරණය**

25. (1) මෙම කමිටුවේ ගණ පූරණය සාමාජිකයින්ගෙන් 1/4ක් විය යුතුය.

(2) සාමාජිකයන්ගේ පුරප්පාඩු පැවතීම කමිටු රැස්වීම්වල තීරණ ගැනීම සඳහා බාධාවක් නොවන්නේය.

**රැස්වීම් තීරණ**

26. කමිටුව විසින් එහි රැස්වීම්වල කාර්යය කරගෙනයාම සඳහා අවශ්‍ය කාර්ය පටිපාටි සම්පාදනය කර ගත හැක්කේය.

**කමිටුවේ බලතල සහ කාර්යභාරය**

27. පළාත් කෘෂිකර්ම කමිටුවේ කාර්යභාරය වන්නේය —

(1) ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කරවීම.
(2) ප්‍රඥප්තියේ සඳහන් කාරණා මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාළ කාරණා පිළිබඳව උපදෙස් ලබා දීම.
(3) පළාත් කෘෂිකර්ම සැලැස්ම අනුමත කිරීම
(4) පළාත් කෘෂිකර්ම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් සහ සහාය ලබාදෙමින් ඒ පිළිබඳ පසු විපරම සහ අගැයීම්
(5) පළාත තුළ කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළුවලදී අවශ්‍ය තීරණ ලබාදීම.
(6) පළාත තුළ කිසියම් ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමක් පළාත් බද කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, කෘෂිකාර්මික සේවා සැපයීම, සහ පළාත්බද පර්යේෂණ උදෙසා කිසියම් කටයුත්තක් සිදු කිරීමට ප්‍රථමයෙන් අනුමැතිය ලබා දීම;
(7) අඳගොවීන් ගේ අයිතිවාසිකම්වලටද කෘෂිකාර්මික ඉඩම් කෘෂිකාර්මික නොවන කාර්යයන් සඳහා පාවිච්චිකරන තැනැත්තන් විෂයෙහි සීමා කිරීම් පැනවීමටද, කෘෂිකාර්මික ඉඩම් කෘෂිඵලදාව ලබාගැනීම සඳහා උපරිම මට්ටමින් යොදා ගැනීමටද වගබලා, ගැනීම.

### 3 වැනි කොටස

*කෘෂි නිෂ්පාදන සංවර්ධන සංවිධාන*

කෘෂිකාර්මික ස්වේච්ඡා සමිති පිහිටුවීම හා ලියාපදිංචිය.

28. අමාත්‍යවරයාගේ, ලේකම්වරයාගේ සහ අධ්‍යක්ෂවරයාගේ උපදෙස් යටතේ පළාතේ කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ගොවීන් ඒකාබද්ධ කර මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන කෘෂි සංවර්ධන ස්වේච්ඡා සංවිධාන පිහිටුවාගත හැකි අතර එම සෑම සමිතියක්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතුවන්නේය.

සමිතියේ නම.

29. මෙම සමිති කෘෂිකාර්මික සංවර්ධන සමිති නාමයකින් පවත්වාගෙන යා යුතුවන්නේය

පොදු ව්‍යවස්ථාව.

30. එම සමිති සඳහා පොදු ව්‍යවස්ථාවක් දෙපාර්තමේන්තුව විසින් සකස්කල යුතු අතර එම ව්‍යවස්ථාව අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වන්නේය. එම සමිතිවල පරිපාලනය හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් නීති පැනවීමේ බලය අමාත්‍යවරයාට පැවරේ.

සමිතියේ අරමුණ.

31. මෙම සමිති යම් බෝගයක් හෝ යම් නිශ්චිත කෘෂිකාර්මික සංවර්ධන අරමුණක් සඳහා වියයුතු වන්නේය.

පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය බල මණ්ඩලය.

32. එම සමිතිවලට පළාත්, කලාප හා ප්‍රාදේශීය වශයෙන් බල මණ්ඩල පිහිටුවා ගත හැකි අතර එම බල මණ්ඩලවල සංයුතිය, කාර්යභාරය සහ පොදු විධිවිධාන සම්බන්ධයෙන්වන ව්‍යවස්ථාව දෙපාර්තමේන්තුව විසින් සෑදිය යුතු අතර ඒ සඳහා පළාත් කමිටුවේ අනුමැතිය ලබාගතයුතු වන්නේය.

ලියාපදිංචිය අවලංගු කිරීම සහ ඈවරකිරීම.

33. මෙම සමිතිවල අරමුදල් වර්ධනය සඳහා රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ව්‍යාපෘති මගින් ලබාදෙන මුදල් යොදවා ගත හැකි වන්නේය.

(1) සමිතියක ලියාපදිංචි කිරීම අවලංගු කිරීම සහ එහි කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා ඈවරකරුවකු හෝ ඈවරකරුවන් පත්කිරීම

33.1.1. ඒ සමිතියේ සාමාජික සංඛ්‍යාව දොළහකට අඩු වේ නම් ; හෝ

33.1.2. සමිතිය ලියාපදිංචි දින පටන් එක් අවුරුද්දක් ඉක්මවන කාල පරිච්ඡේදයක් එය ක්‍රියාත්මක නොවී ඇත්නම් ; හෝ

33.1.3. සමිතියේ පරමාර්ථවලට පටහැනිව සමිතිය කටයුතු කර ඇති බව හෝ එහි සාමාජිකයන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමින් ඒ සමිතියේ සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් ලේකම්වරයා වෙත ඉල්ලීමක් කරනු ලබන්නේ නම් හෝ

ලේකම්වරයා විසින් කරනු ලැබිය හැකිය.

(2) එම අවලංගු කිරීම පිළිබඳව නිවේදනය පිළිවෙලින් සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂාවලින් සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබිය යුතු ය.

(3) සංවිධානයේ කටයුතු ගණන් බේරා වසා දැමීම සඳහා පත් කරන ලද ඈවරකරුවාට හෝ ඈවරකරුවන්ට—

33.3.1. සංවිධානයේ ණය හිමියන් අතර ප්‍රමුඛතාවයට අදාල යම් ප්‍රශ්නයක් තීරණය කිරීමේ;

33.3.2. සංවිධානයේ දේපල විකිණීමේ;

33.3.3. ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව සමිතිය විසින් හෝ ඊට එරෙහිව හිමිකම් පෑම් කිසිවක් සමථයයකට පත් කිරීමේ;

33.3.4. සමිතියේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදා හැරීම සඳහා කටයුතු කිරිමේ

බලය ඇත්තේය.

(4) සමිතිය ඈවර කිරීමේ එහි අරමුදල ඈවර කිරීමේ වියදම පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර ඉක්බිතිව එහි බැරකම්වලින් නිදහස් වීම සඳහා යෙදවිය යුතුය. ඈවර කිරීම නිම කිරීමෙන් පසුව ඉතිරිවන අතිරික්තය දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

## 5 වැනි කොටස

### *පොදු විධිවිධාන*

34. පළාත තුල කිසියම් ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක් වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් පළාත්බද කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, කෘෂිකාර්මික සේවා සැපයීම, සහ පළාත්බද පර්යේෂණ උදෙසා කිසියම් කටයුත්තක් සිදු කිරීමට පෙර පළාත් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුවන්නේය. (කෘෂිකාර්මික කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීම)

35. ඉහත 7 ඡේදය අනුව අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරණු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් දිනක සිට හෝ එම නියෝගය ක්‍රියාත්මක විය යුතු වන්නේය. (නියෝග ගැසට් පත්‍රයේ පළ කිරීම)

36. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම ඒ යටතේ කලින් කරනු ලැබූ යම් දෙයකට අගතියකින් තොරව පරිච්ඡින්න විය යුතු අතර ඒ පිළිබඳව නිවේදනයක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතුවන්නේය. (නියෝග සඳහා පළාත් සභා අනුමැතිය ලබා ගැනීම.)

37. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ හෝ සාදන ලද යම් නියෝගයක් හෝ විධිවිධානයක් හෝ කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ උවමනාවෙන්ම අවහිර කරන අයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවකු වන්නේය. (වැරදි) :

38. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදුකරනු ලැබූ විට නඩු පැවරීමේ බලය පළාත් අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු සතු වන්නේය.

39. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදුකරනු ලබන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව රු. 20,000 නොඉක්මවන දඩයකට හෝ මාස 06ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේය. (දඬුවම)

## 6 වැනි කොටස

### *අර්ථ නිරූපන*

40. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස— (අර්ථ නිරූපන)

"පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයා ද,

"ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම විෂයභාර අමාත්‍යංශයේ ලේකම්වරයා ද,

"දෙපාර්තමේන්තුව" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද,

"අධ්‍යක්ෂ" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා ද,

"කෘෂිකර්මය" යන්නෙන් ජනතාවගේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම පිණිස වාණිජමය අරමුණු සහිතව හෝ රහිතව (අපනයන කෘෂිකාර්මික බෝග වශයෙන් ගැසට් කර ඇති බෝග හා වැවිලි බෝග හැර) සියලුම ප්‍රයෝජනවත් ශාක වගා කිරීම සහ සංරක්ෂණය කිරීම ද,

"කෘෂිකාර්මික ප්‍රවර්ධනය" යන්නෙන් කෘෂිකාර්මික සම්පත් ප්‍රශස්ථ ඵලදායිතාවයක් දක්වා වර්ධනය කිරීම ද,

"කෘෂිකාර්මික ව්‍යාප්තිය" යන්නෙන් ආහාර නිෂ්පාදනය, සංවර්ධනය හා කෙඳි නිෂ්පාදන සඳහා බෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වූ තාක්ෂණික ක්‍රමවේදයක් ගොවීන් හා වෙනත් උනන්දු කණ්ඩායම් අතරට ගෙනයාම, ක්‍රියාත්මක කිරීම හා සහාය වීමේදී අවශ්‍ය සම්පත් සම්පාදනයට මැදිහත් වීම ද,

"කෘෂිකාර්මික අධ්‍යාපනය" යන්නෙන් ආහාර හා කෙඳි නිෂ්පාදන සඳහා බෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වූ තාක්ෂණික ක්‍රම වේදයක් ගොවීන් හා වෙනත් උනන්දු කණ්ඩායම් අතරට ගෙනයාම, ක්‍රියාත්මක කිරීම හා සහාය වීමේදී ගොවීන් සහ අදාළ කණ්ඩායම් වෙත අවශ්‍ය වන්නා වූ දැනුම, කුසලතාවය ලබා දීම සහ ආකල්ප සංවර්ධනය කිරීම ද,

"කෘෂිකාර්මික සේවා" යන්නෙන් පළාත් බද කාර්ය සඳහා කෘෂිකර්ම ව්‍යාප්තියේ සහ ප්‍රවර්ධනයේ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අවශ්‍ය වෙතැයි නිශ්චය කරනු ලබන ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන හා ජීවී හෝ අජීවී යටිතල පහසුකම් සැපයීම ද,

"පළාත් බද කෘෂිකාර්මික පර්යේෂණ" යන්නෙන් පළාත් මට්ටමින් කෘෂිකාර්මික ක්‍රියාවලියේදී ඇති වන්නා වූ තාක්ෂණික ගැටළු සහ ඒ සම්බන්ධ ගැටළු තත්ත්වයන් නිරාකරණය කිරීම හා නිර්දේශ ලබා ගැනීම සඳහා සහ හඳුන්වා දෙනු ලබන තාක්ෂණ හා නිර්දේශවල අදාලත්වය තහවුරු කිරීම සඳහා පළාත් මට්ටමින් කරනු ලබන (මූලික සිද්ධාන්ත ගොඩැගීම සඳහා වූ නොවන) අත්හදා බැලීම්ද.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

"කෘෂිකර්ම කමිටුව" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම කමිටුව ද

"කෘෂි නිෂ්පාදන සමිති" යන්නෙන් කෘෂි නිෂ්පාදනයක ප්‍රවර්ධනය අරමුණු කරගත් සාමූහික ගොවි කණ්ඩායමක් ද,

"ගොවි සංවිධාන බල මණ්ඩල" යන්නෙන් ගොවි සංවිධාන හා නිෂ්පාදන සමිති ඒකාබද්ධව ගොඩනගාගත් ඒකකයක් ද,

41. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා අතර අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

04-319

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.